
# අංකූර ප්‍රේතවස්තුව



පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි




| මාර්ගය අංගය | අර්ථය/ චෛතසිකය | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|
| සම්‍යග් දෘෂ්ඨිය<br>02 | නිවැරදි දැකීම<br>(අමෝහ/ ප්‍රඥා චෛතසිකය) | 1. දශ වස්තුක සම්‍යග් දෘෂ්ඨිය<br>2. චතුස්සත්‍ය සම්‍යග් දෘෂ්ඨිය<br>යන දෙකින් දෙවන සම්‍යග් දෘෂ්ඨිය ඇති කර ගැනීම ප්‍රධාන වේ. |
| සම්‍යග් සංකල්පය<br>03 | යහපත් කල්පනාව<br>(විතර්ක චෛතසිකය) | 1. නෛෂ්මය (පඤ්ච කාමයන්ගෙන් මිදීමට සිතීම)<br>2. අව්‍යාපාද 3. අවිහිංසා<br>යන සංකල්පනා ඇති කර ගැනීම. |
| සම්‍යග් වචන<br>04 | අයහපත් වචනයෙන් වැලකීම<br>(විරති චෛතසිකය) | 1. මුසාවාදා 2. පිසුනාවාචා<br>3. පරුසාවාචා 4. සම්ඵප්‍රලාප<br>යන මේවා කීමෙන් වැලකීම. |
| සම්‍යග් කම්මන්ත<br>03 | අයහපත් කායකම්වලින් වැලකීම<br>(විරති චෛතසිකය) | 1. ප්‍රණ ඝාතය 2. අදත්තාදානය<br>3. කාමයෙහි වරදවා හැසිරීම<br>යන මෙම ක්‍රියාවන්ගෙන් වැලකීම. |
| සම්‍යග් ආජීවය<br>05 | අයහපත් දිවි පැවැත්මෙන් වැලකීම.<br>(විරති චෛතසිකය) | 1. ආයුධ වෙළදාම 2. වහල් වෙළදාම<br>3. මස් වෙළදාම 4. මත්පැන් වෙළදාම<br>5. විෂ වෙළදාම<br>ආදියෙන් ජීවත් නොවීමයි. |
| සම්‍යග් ව්‍යායාමය<br>04 | යහපත් උත්සහය<br>(වීර්‍ය්‍ය චෛතසිකය) | 1. උපන් අකුසල් දුරු කිරීමට<br>2. නූපන් අකුසල් නූපදීමට<br>3. උපන් කුසල් දියුණු කිරීමට<br>4. නූපන් කුසල් උපදවා ගැනීමට උත්සහ කිරීම. |
| සම්‍යග් ස්මෘතිය<br>04 | යහපත් සිහිය<br>(සති චෛතසිකය) | 1. කාය 2. වේදනා 3. චිත්ත 4. ධම්ම<br>යන අරමුණු තුළ සිහිය මනා කොට පැවැත්වීම.<br>(සතර සතිපට්ඨානය) |
| සම්‍යග් සමාධිය<br>04 | යහපත් එකගබව<br>(ඒකාග්‍රතා චෛතසිකය) | 1. ප්‍රථම ධ්‍යාන 2. ද්විතීය ධ්‍යාන<br>3. තෘතීය ධ්‍යානය 4. චතුර්ථ ධ්‍යාන යන්හි සමාධිය, එකඟබවග<br>අභිධර්ම දේශනාව අනුව ධ්‍යාන 5කි). |

**සංස්කාරක හිමිගෙන්...**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

අද මේ කල එළි දක්වන දහම් ග්‍රන්ථය මුලින්ම සංස්කරණය කරනු ලැබුයේ ක්‍රිස්තු වර්ෂ 2018 ඔක්තෝම්බර් මස 28 දාය. එතෙක් මෙතෙක් ප්‍රසිද්ධියට පත් කිරිමට නොහැකි වූ නිසා නැවත වරක් කියවා බලා එදාට වඩා මෙහි වටිනාකම තේරුම් ගිය නිසා නැවතත් උත්සහ කිරීමක් වශයෙන් ක්‍රිස්තු වර්ෂ 2019 අගෝස්තු මස 10 දා වන විට කියවා බලා වර්තමානයට ඉතාම අවශ්‍ය කරුණු කාරණා ඇතුලත්ව ඔබ අතට පිළිගන්වමි. මේවා නවකතා, කෙටිකතා, පුවත්පත් වාර්තා කියවන ආකාරයට කියවීම නොව, කියවන කොටස සිතට තැන්පත් කරගෙන බුදු සසුනක තිබෙන අගය හා වර්තමානයේ භාජනයක අඩක් වතුරත්, අනෙක් කොටසේ කිරිත් තිබියදී රණහංසයා වතුර ටික ඉතිරිවන්න කිරි ටික බොන ආකාරයට දහමට ලැදියෙන් ගෞරවයෙන් සීලයෙහි පිහිටා කියවීම වටිනවා.

වර්තමානයේ ඉතා ප්‍රසිද්ධ අය ඉතා ප්‍රසිද්ධ මාධ්‍යන්වල ධර්මය විකෘති කරමින්, මාරපාක්ෂිකව ක්‍රියා කිරීම ගැන ඝණගාටුයි. මෙම දහම් පොත කියවා ගන යාමේදී අවසාන භාගයේදී කියවෙනවා අංකූර රජතුමාගේ පාලන කාලයේ මිනිසාගේ පරම ආයුෂ අවුරුදු විසිදහසක් සහ අබුද්ධෝත්පාද කාලයක් කියා, එම කොටසින් පසු වරහන් දෙකක් තුළ මාගේ වාක්‍යක් ඇතුළත් කර ඇත.

කියවන සැනෙන් සිතට එන විචිකිච්ඡාව නවතා දැමීම සඳහායැයි එසේ කලේ ඒ කුමක්ද? භාග්‍යවත් අරහත් කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලෝ පහල වී වදාලේත් පරමායුෂ අවුරුදු විසිදහසක කාලයකයයි. අපේ ගෞතම බුදුරජාණන්වහන්සේ දේශනා බොහෝමයකම එම බුදුරජාණන්වහන්සේගේ ගුණ සඳහන් වෙනවා මෑතකදි නිකුත් වූ දහම් සඟරාවක පලවී තිබුණා අවුරුදු දසලක්ෂයකට සහ විසිපන් ලක්ෂයකට පරතරවල් තුළ බුදුරජාණන්වහන්සේලාගේ පහලවීම ගැන පැරණි පූජාවලි පොත්වහන්සේ නමක් තුළ සඳහන්ව තිබෙනවා. නිරෝකුඩ්ඩ ප්‍රේතයන් මහා කල්ප 92ක් අටමහනිරයෙ හා ප්‍රේත භවයේ අප්‍රමාණ දුක් පීඩා විඳවා කාශ්‍යප බුදුරජාණන්වහන්සේගෙන් පිළිසරණයක් පැතූ අවස්ථාවේ වදාළ සිටියේ මාගේ ශාසනය තුළත් තොපගේ දරුණු අකුශලය බලවත් නිසා පිළිසරණක් ලබා ගැනීමට නොහැකිවූවත් මීලඟ අතුරු කල්පයෙහි මා සේම ගෞතම නමින් සම්මා සම්බුදුරජාණන්වහන්සේ නමක් ලෝ පහලවන බවත්, එවිට භාග්‍යවත් ඵුස්ස බුදුරජාණන්වහන්සේගේ දාන ශාලා ගබඩා භාරව සිටි ඥාතියෙක් එම බුදුරජාණන්වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දන්, පැන්, පිරිකර, ආවාස පූජා කර තොප ප්‍රේත අපායෙන් මුදවා දිව්‍ය ආත්ම සම්පත් ලබා දෙන බව.

ඒ අසා සිටි ප්‍රේතයෝ තමන් සිටි තත්වය, අවස්ථාව, කාලය නොදැන හෙට දිනයේ ලැබෙන දෙයක් සේ සිතා සතුටු වූහ. එවිට භාග්‍යවත් අරහත් කාශ්‍යප බුදුරජාණන්වහන්සේ වදාළ සිටියේ “තොප සිතා සිටින ආකාරයට එම භාග්‍යවත් අරහත් ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේ පහලවන කාලය, අවුරුදු දහසකට අඟලක් වශයෙන් මේ පෘථිවිය වර්ධනය වෙමින් අවුත් ගව් හතක (සැතපුම් විසි අටක්) කාලයක් ගෙවී යන්නේ ”යැයි වදාළ සේක.

ඒ අනුව අපට සිතාගත හැකියි භාග්‍යවත් අර්හත් මෛත්‍රී සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාරන්නටත් ගෙවෙන කාලය භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාලේ පරමායුෂ අවුරුදු විසිදහසේ සිට අවුරුදු දහය දක්වා පහත බැස නැවත ආයු වර්ධනය අවුරුදු අසංඛ්‍යය දක්වා වර්ධනය වෙමින් අවුත් නැවත ආයු පිරිහී අවුරුදු එකසිය විස්ස දක්වා ගෙවුනු කාලයයි ගව් හත.

වර්තමානයේ පරමායුෂ අවුරුදු අසූවයි. අපගේ බුදු සසුන තව ඉදිරියට අවුරුදු 2400ක් පවතිනවා. මීට අවුරුදු 2600කට පෙර පරමායුෂ අවරුදු 120යි. බුදු සසුනකුත් තිබියදී මේ කෙටි කාලයේදි පරමායුෂ අවුරුදු 40න් බැස්සා නම්, ඉදිරියට තිබෙන ශාසන කාලය අවවුරුදු 2400න් අවසන් වූ පසු තව අවුරුදු 2600 කාලය තුළ අතුරු කල්පයෙන් අඩක් ගෙවී යාමට ගතවෙන්නේ සැතපුම් 14කටත් අඩු කාලයකි. ඒ මෙසේයි. අවුරුදු 120ක පරමායුෂ ඒමට පෙර භාග්‍යවත් අරහත් මෛත්‍රී සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාරන්නේ පරමායුෂ අවුරුදු අසූදහසකට වැඩි කාල වකවානුවක් තුළදීයි. එම නිසා පෘතග්ජන බොහෝ දෙනාගේ ප්‍රාර්ථනාව වූ දෙව් මිනිස් සැප කෙලවර අමා මහ නිවන් සම්පත්තිය ලැබේවා’යි කියන ප්‍රාර්ථනාවන් ඉෂ්ට සිද්ධ වන්නට කාලයයි.

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්දස්ස !!!**

මහා මංගල සූත්‍ර දේශනාවේ සඳහන් මංගල කාරණා තුනක් සඳහන් ගාථා පාඨයෙහි සඳහන් වූයේ **දානඤ්ච** (ශ්‍රමණ බ්‍රාහමනාදීන්ට දිය යුතු) ආමිස දාන, ධර්ම දානයද, **ධම්මචරියාච**, දස අකුසලකර්මාදියෙහි හැසිරීම ද **ඤාතකානඤ්ච සඞගහො**, මව් පිය දෙපාර්ශවයෙන් පැවත එන්නා වූ සතර වරිග කුල පරම්පරාව දක්වා දුක්ඛිතව තමන්ලා වෙත එන නෑදැයන්ට කළ යුතු හා කිරීමට හැකි උපකාර කිරීමද, **අනවජ්ජානි කම්මානි**, පස් පවු, දසඅකුසල්, නොකටයුතු වෙළඳාදියෙන් වැළකීමද, **ඒතං මංගල මුත්තමං**, උතුම් මංගල කාරණාමය.

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්දස්ස !!!**

තවද එක් සමයෙක්හි අපගේ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ සිටින සමයෙහි අංකූර ප්‍රේතයා අරමුණු කර දේශනා කර වදාල සේක. මෙහි අංකූර නමින් ප්‍රේතයෙක් හැඳින්වූවත් ඔහු ප්‍රේතයෙක් නොවුවත් ඔහුගේ ජීවිත චරිතය ප්‍රේතයන් සම්බන්ධයෙන් ගිය නිසා මෙනම භාවිත විය.

උත්තර මධුරා නුවරට අධිපති වූ මහා සාගර රජතුමාගේ පුත්‍රයකු වූ උපසාගර කුමරු නිසා උත්තරාපථයෙහි කංසභෝගයෙහි වූ අසිතඤ්ජන නම් නුවර මහා කංස රජකෙනෙකුගේ දියණියක වූ දේවගර්භා නම් දේවිය කුස උපන් අඤ්ජන දේවිය, වාසු දේවය, බල දේවය, චන්ද දේවය, සූරිය දේවය, වරුණ දේවය, අජ්ජුනය, පජ්ජුනවය, ඝන පණ්ඩිතය, අංකූරය කියා වාසුදේවයා ආදි කොට යම් ඒ සහෝදරයන් දස දෙනා සමඟ අඤ්ජන දේවි ඇතුලු එකොලොස් ක්‍ෂත්‍රිය කෙනෙක් වූහුද, ඔවුන් අතරින් වාසු දේවයා ආදි කොට ඇති සොහොයුරො අසිත අඤ්ජන නුවර ඇතුලුව වාරවතී නුවර අවසන්කොට දඹදිව හැට දෙදහසක් නගරවල සියලු රජවරුන් සමුහ බලයෙන් මරා වාරවතී නුවර කොටස් දහසකට වෙන් කලාය. ඔවුන්ගේ සොහොයුරිය වූ අඤ්ජන දේවිය අමතක විය. පසුව ඇය ගැනත් සිහි වී කොටස් එකොලහකට බෙදමුයි කී කල්හි, බාල සොහොයුරා වූ අංකූර, මට අයිති කොටස ඇයට දෙන්නැයි ද මම වෙළඳාම් කර ජීවත් වෙමියි කියා ඔබ හැම තම තමන්ගේ ජනපදවල සුංකම (අයබදු) මට හරිවූ කියාද කීවේය. එයට සැවොම එකඟව පාලනය කලේය.

තම පිරිසෙන් වෙන් වූ බාල සහෝදරයා වෙළඳාම් කරමින් උපයන ධනයෙන් දන් දෙමින් සිටියහ. ඔහුට හොඳ හිතවත් සේවකයෙක් සිටියේය. අංකූර තෙම ඔහු ගැන පැහැදී විවාහයක්ද කර දුනි. ඔහුගේ බිරිඳට දරු ගැබක් හටගත් කල්හී එම සේවකයා මිය ගියේය. අංකූර තෙමේද තම හිතවත් සේවකයා මිය ගිය පසු එම මවටත්, දරුවාටත් තම සේවකයාට දුන් වැටුප් ආදිය නොඅඩුව සැපයීය. එම දරුවා තරුණ වයසට පැමිණි කල්හී මේ දරුවා දාසයෙක් වේවිද? නොවේ දැයි රජ කුලයෙහි ප්‍රශ්නයක් මතුවිය. ඒ බැවු අසා අඤ්ජන දේවිය දෙදෙනෙකු උපමා කොට මව, සැමි දුවක් බැවින් පුත්‍රයාද ස්වාමියෙක්මය කියා එකුමරු දාස භාවයෙන් නිදහස් කලහ.

ඉන්පසු එම කුමරුද ලැජ්ජාවෙන් එහි විසීමට නොහැකිව හේරුව නගරයට ගොස් සන්නාලි දියණියක් සරණ පාවා ගෙන සන්නාලි ශිල්පයෙන් ජීවත් විය. එකල්හි හේරුව නුවර “අසයිහ” නම් මහා සිටුතුමෙක් වාසය කළහ. මෙතුමා මහණ බමුණන්ට සහ දුගී මගී යාචකාදීන්ට දිනපතා දන් දෙයි. මෙම සන්නාලි පුත්‍රයාද එම සිටාණන්ගේ නිවස නොදන්නා දුගි මගී යාචකාදීන්ට මහත් අනුකම්පාවෙන් යුතුව තම දකුණු අත දික්කර එම සිටාණන්ගේ නිවසට යන

පාර පෙන්වා දෙන්නේය. ඔහු පසුව කළුරිය කොට වාලුකා කාන්තාරයක නුග ගසක භූමස්ත දෙවියෙක්ව උපන්නේය. ඔහුගේ දකුණු අත කැමති සම්පත් ලබා දෙන්නේය. එම හේරුව නගරයෙහි අසයිහ සිටුතුමාගේ දානයෙහි ව්‍යාපෘත වූ ශ්‍රද්ධා නැතිවූ අප්‍රසන්න වූ මිත්‍යා දෘෂ්ටික වූ පින් දහම් වලට විරුද්ධ වූ තවත් එවැනිම පුද්ගලයෙක් කළුරිය කොට මුලින් සඳහන් දිව්‍ය පුත්‍රයා වසන ස්ථානය අසල ප්‍රේතයෙක්ව ඉපදුනි. ඔහු විසින් කරන ලද කර්මයම පලියෙහිම ආවේය. මේ අතර අසයිහ සිටුතුමාද කළුරිය කොට තව්තිසා දිව්‍ය ලෝකයෙහි සක් දෙව්දුන්ට එක්වන ආත්මයක් ලදහ.

මෙසේ කල්යාමේදි අංකුර තෙමේ පන්සියයක් ගැල් පුරවා වෙළඳාම පිණිස බඩු රැගෙන එම වාලුකා කාන්තාරය හරහා ගියහ. ඒ ආකාරයටම තවත් ගැල් පන්සියයක භාණ්ඩ රැගෙන තවත් වෙළෙන්දෙක් මෙම ගමනට එකතු වූහ. එසේ ගමන් කිරීමේදි මං මුලා වී බොහෝ දුරක් ගොස් ගබඩා කරගෙන තිබූ ජලය හා ගොනුන්ට දීමට තිබූ තණ ආදියද අවසන්වන්නට වූහ. මේ බැවූ තේරුම්ගත් අංකූර තෙමේ ඔහුගේ පිරිස යවා පැන් තිබෙන ස්ථානයක් සොයා එන ලෙස පිටත් කළහ. මේ අතර නුග රුකට අධිගෘහිත දේවතාවාට මොවුන් පත්වී තිබුණු අසීරුතාවය පෙනී තමන්ට පෙර කරන ලද උපකාරය සිහිපත් වී තමන් වසන නුග රුක ඔවුන්ට පෙන්වූහ. එම නුග රුක යොදුනක් පමණ ප්‍රමාණය වසා තිබෙන සැම දිශාවකටම විහිදී තිබූ මහත් විශාල අතු අවු, වැසි වලට සෙවනක් දෙන අංකුර දෙවියන්ගේ විමන පිහිටි ස්ථානයට ඔවුන්ට රැකවරණය සලසන ලදි.

එම න්‍යාග්‍ර රුකට අධිගෘහිත දේවතාවා ඔවුන්ගේ සියලු පහසුකම් ආහාර පාන වර්ග නොඅඩුව ලබා දිමේදී ගැල් හිමි බමුණාට මෙවන් නරක සිතක් ඇති විය. අපි දැන් ගමට ගිය පසු ආදායම් මාර්ගයක් සඳහා මොනවා කරන්නද? ඒ නිසා මේ දෙවියා මොන උපායකින් හෝ අපගේ වාහනයක නංවා ගමට ගෙන ගොස් අපගේ අවශ්‍යතා ලබා ගත හැකි, යැයි සිතා අංකූරයාට මෙසේ කීවේය. අප යම් අරමුණක් සඳහා කාම්බෝජ රටට මෙතන සිට යාමට අවශ්‍යද, එම අවශ්‍යතාවය එහි නොගොස් මෙහෙන්ම සිදු වුණි. ඔබද අපට කැමති කැමති දේ ලබා දෙයි. එම නිසා ඔබ අප සමඟ ආපසු වාරවතී නුවරට යාමට එන්න. ඔබ කැමැත්තෙන් නොඑනවානම් අපගේ යානයක බඩු ඉවත් කර ඔබව එහි බැඳගෙන වාරමති නුවරට රැගෙන යනනෙමු'යැයි කීහ.

එවිට අංකූර දිව්‍ය පුත්‍රයා සත්පුරුෂ ධර්මයෙහි සිට එම අදහසට එකඟ නොවී මෙසේ පැවසීය. යම් ගසක් යට සෙවනට, ප්‍රයෝජනයට ගත්තේද, එම ගසේ අතු කඩන්නේ නැත. එසේ කරන්නේ නම් ඔහු මිත්‍ර ද්‍රෝහියෙකි. යමෙත් තද අවු රශ්මියකින් පීඩාවට පත් වූ අවස්ථාවක හෝ තද වර්ෂාපතනයකට හසු වූ අවස්ථාවක හෝ ගමන් කිරීමේදී විඩාවට පත් වූ අවස්ථාවක හෝ ගසක මුලක පිහිටක් ගත්තේද එම ගසට ඔහු ගරු සරු කරන්නේ නම් ඔහු සත්පුරුෂයෙකි. එම ගසට හානි කිරීම හෝ අතු විනාශ කිරීම හෝ කරන්නේ නම් ඔහු අසත්පුරුෂයෙකි. ගස කෙරෙහි නපුරක් නොසිතන්නේය. සත්වයන් ගැන නපුරක් කිරිම සිතීම ගැන කවර කතාද? එම නිසා මෙම දිව්‍ය පුත්‍රයාද සත් පුරුෂයෙකි. අප දුකට පත් වූ වෙලෙහි පිහිට වූයේය. එම නිසා මෙම දිව්‍ය පුත්‍රයා කෙරෙහි කිසි නපුරක් නොසිතිය යුතුය. කළ උපකාර සිහිපත් කර දිව්‍ය පුත්‍රයාට අවැඩක් සිතීම පවා මිත්‍ර ද්‍රොහිය. මොහු පිදිය යුතු උත්තමයෙක් යැයි සිතා ගත යුතුයි.

එවිට බමුණා එබස් අසා "අර්ථයාගෙ මූලය විනය තෙමකනී" යි කියන නීති මඬගලය නිසා මොහුට විරුද්ධව පින්වත් දිව්‍ය පුත්‍රයා යම් ගසක සෙවණෙහි සිට හෝ නිදා සිට හෝ එබඳු දැව සම්භාරයකින් යම් ප්‍රයෝජනයක් වේ නම් එම

ගස කපා ගන්නේය. අතු ගැන කවර කතාදැයි කී පසු නැවතත් අංකුර දිව්‍ය පුත්‍රයා සත් පුරුෂ ධර්මයෙහි සිට මෙසේ කීවේය. බ්‍රාහ්මණය, යම් ගසක සෙවණ හෝ නිදා සිට හෝ එම ගසෙන් යම් උපකාරයක් ගන්නේ නම් ගසේ කොළයක් හෝ කැඩීම නොකල යුතුයි. ගස කැපීම කොපමණ මිත්‍රද්‍රෝහී වැඩක්ද? එබස් පිළි නොගත් බ්‍රාහ්මණයා නැවතත් මෙසේ තම මතයේම සිටියේය.

නැවතත් අංකුර දිව්‍ය පුත්‍රයා මෙසේ කීවේය. බ්‍රාහ්මණයා යම් නිවසක අතරමංවූවෙකු එක රැයක් හෝ නවාතැන් ගත්තේ නම්, එම නිවසින් ආහාර පාන ගත්තේ නම්, එම උපකාර කළ පුද්ගලයා හට සිතින් පවා වරදක් නොසිතිය යුතුය. කයින් හෝ වචනයෙන් නපුරක් කිරීම ගැන කවර කතාද? මක් නිසාද යත් කෙලෙහිගුණ සැලකීම බුදුරජාණන් වහන්සේ පවා මහත් වර්ණනාවෙන් පෙන්වා වදාළ සේක. සර්වඥතා ඥානය ලබා ගැනීමට දෙවියන්, බ්‍රාහ්මයන් පවා භියට පත්කරවා හිස් ලූ ලූ අත පැන යන්නට හා වජ්‍රාසනය මතුවී මා හට සතියක් පුරා චිත්ත, කායික විවේකයෙන් වැඩ සිටීමට හා මුලු මහත් මාර බලයට එකඳු බෝ පත්‍රයකට පවා අනතුරක් නොමැතිව පන්දහසක් අවුරුදු ශාසනය පවතින කාලවකවානුව තුළ කොපමණයැයි කිව නොහැකි සත්ව සන්හතියකට නිවනේ මහත් මෙතෙකැයි කිව නොහැකැයි සත්ව සන්හතියකට මෛත්‍රී බුද්ධ ශාසනය තුළ සතර අපා අටමහ නිරයන්හි දොර වසා සුගතිගාමී මාර්ගය සලසා දෙන බැවු සර්වඥතා ඥාණයෙන් දුටු නිසා එයට කෙළෙහිගුණ සැලකීමක් වශයෙන් සුජාතා දේවියගේ කිරි පිඩු දානයෙන් පසු දෙවන සතියෙහි ඇසි පිය නොහෙලා දිවා රාත්‍රී සත් දිනක් ගෙවන තෙක් අනිමිසලෝචන පූජාව කළ ආදර්ශයට ගත යුතුය.

එම නිසා බ්‍රාහ්මණය යම් උපකාරයක් කළ තැනැත්තාට එයට ප්‍රති උපකාරයක් කරනවා වෙනුවට නපුරක් අහිතක් කලොත්, ඔහුට එහි අනිටු විපාක ඒ පිටුපසම පැමිණ නපුරු දුක් විපාක මෙතෙකැයි මෙලොව පරලොව වශයෙන් විඳවන්නට වන්නේය. ඉන් පසු එම බමුණා නිශ්ශබ්ද විය. මේ දෙදෙනාගේ කතාව අසා සිටි දෙවි දේවතාවෝ බමුණා කෙරෙහි කිපී මේ දූෂ්ටයාට කළ යුතු දේ දනිමි ‘යි සිතා සිටියහ.

ඉන්පසු නුග රුකට අධිගෘහිත දිව්‍ය පුත්‍රයා මෙසේ පැවසීය. මම කිසියම් මිනිසෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ සදෙවු ලෝ මහේශාක්‍ය දෙවියෙකුගෙන් හෝ චක්‍රවර්තී රජ කෙනෙකුගෙන් හෝ බලයකින් හෝ මැඩ පැවැත්විය නොහැකි බලවත් දෙවියෙකි. දෙවියෝ මහානුභාව සම්පත්නයෝය. තම තමන්ගේ පින් බලයෙන් බලය ලැබූ මිනිසුන් පවා ප්‍රයෝග විපත්තියක් නැති කල්හි මැඩපවත්වන්නට නොහැකි වෙති. වෙනත් දෙවියන් ගැන කවර කතාද? මාගේ පින් බලයෙන් මම දෙවියෙක් බවට පත් වීමි. මම දෙවියෙක් වූවත් එසේ මෙසේ දෙවියෙක් නොවෙමි. රූප සම්පත්තියෙන්ද, කාය ශක්තියෙන්ද සම්පූර්ණ දෙවියෙක්මි. රූප සම්පත්තිය හේතුකොටගෙන අන්‍යයන්ගෙන් ගරුබුහුමන් ලබමි.

ඉන් පසු දෙදෙනා අතර මෙබඳු දෙබසක් ඇති විය.

එම්බා දිව්‍ය පුත්‍රය, ඔබගේ දකුණු අත සර්වකාරයෙන් ස්වර්ණවත් වේ. අත ඇඟිලිවලින් අනුන් කැමති සම්පත් වහනය වෙයි. අම්හිරි, කටුක, කශටාදි, රස ඇති නොයෙක් දේ වැදැරුම් මිහිරි රස වැගිරෙන දේ බවට පත් කරයි. එවන් හාස්කම් බලයක් ඇති නිසා ඔබ වහන්සේ මහානුභාව සම්පන්න දෙදෙවුලොවට අධිපති සක්දෙව් රජ විය යුතු යැයි මා සිතමි.

එවිට දිව්‍ය පුත්‍රයා මෙසේ කීහ. "පින්වත් අංකුරය, මම වෛශ්‍රාවනාදි ප්‍රකට දෙවියෙක් නොවෙමි. මා පූර්ව භවයෙහි හෙරුව නුවරින් චුතව මෙම වාලුකා කාන්තාරයෙහි පිහිටි මෙම නුග රුකට උත්පත්තිය වශයෙන් පැමිණි මහත් සෘදි ඇති ප්‍රේතයෙකැයි දැනගනුව'යි කීවේය".

එවිට අංකුර තෙමේ විමසන්නේ, "දිව්‍ය පුත්‍රය, පෙර ආත්ම භාවයේ හෙරුව නුවර වාසය කළා වූ පාපයෙන් වැලකීම හැරුණු කොට වෙන මොනයම් ශීලයක් රැකීමෙන් මේ තරම් දකුණු අතට පුදුම සහගත හාස්කමක් ලැබීමට හේතුවේයි" විමසීය.

මම එම ආත්මභාවයේ හෙරුව නුවර අඩු කුලයක ඉතා දුක සේ ජීවත් වුණෙමි. දුප්පතකු වශයෙන් ජීවත් වීමේදී තවත් කෙනෙකුට උපකාරයක් කිරීමට තරම් වත්කමක් නැති වූවත් සිතින් දන් දුන්නෙමි. මා ජීවත් වූ පැල්පත තිබුණේ පාපය පිළිකුල් කරපු පින් සිත දියුණු කරන ලද බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි පැහැදීමෙන් දිනපතා දුගී මඟී යාචකාදීන්ට දන් දෙන "මහධන සිටු" අසයිහ බ්‍රාහ්මණතුමාගේ නිවස අසලමය. එම සිටාණන්ගේ දන් බලාපොරොත්තුව නා නා විධ පුද්ගලයෝ නොයෙක් පලාත් වලින් පැමිණ එම සිටාණන්ගේ නිවස තිබෙන ස්ථානය ගැන අසති. එවිට මම මහත් සතුටෙන් යුතුව ආහාර වේලක් දීමට වත්කමක් නැති නිසා මහත් ගෞරවයෙන් යුතුව එම සිටාණන්ගේ නිවස තිබෙන ස්ථානයට යන පාර පෙන්වූයෙමි. ඔවුන් මා පෙන්වූ මාර්ගයේ යන විට මමත් පින් අනුමෝදනා වුනෙමි. එසේ අනුන් විසින් දෙන දානයෙහි පින් අනුමෝදන් වීමේ සතුටු සිතින් දන් දෙන ස්ථානය දකුණත දික් කර පිනේ බලයෙන් මගේ අත කප්රුකක් මෙන්ද, කල්ප ලතාවක් මෙන්ද, කැමති කැමති සම්පත් දෙන්නේය.

නැවතත් අංකුර තෙම කියන්නේ පින්වත් දිව්‍ය පුත්‍රය ඔබ මහණ බමුණන්ට හෝ වෙනත් කිසිවකුට තමා සතු කිසි දාන වස්තුවක් සියතින් නොදුන්නේලු. එනමුත් අනුන් විසින් කරන ලද අනුන්ගේ දානය යහපත මහ දන් පවතී යයි සිතා අනුමෝදනා වීමෙන්ම දකුණත දිගු කොට දන් දෙන තැන යාචකයන්ට පෙන්වූයෙලු. එම කුසලය හේතුකොට ගෙන ඔබගේ දකුණත කැමති කැමති සම්පත් උපදවයි. එම පින හේතුකොට ගෙන ඔබගේ හස්තයෙන් නා නා විධ මිහිරි රස වැගිරයි. අනුන්ගේ පින් අනුමෝදනාවෙන් යාචකාදීන්ට දන්සැල පෙන්වූවාවූ කුසලය හේතුකාට ගෙන ඔබගේ අතෙහි මෙවන් පින් ඵල දෙයි. පිනේ ස්භාවය ඒකාන්තයෙන් ඉතා ආශ්චර්යය වේ යැයි කීවේය. තවද පින්වතුන් වහන්ස අනුන් විසින් පවත්වන ලද දානය අනුමෝදනවූ ඔබවහන්සේට පළමු කොට මෙබඳු විපාකයන් මෙබඳු ආනුභාවයක් වේ නම් එම "අසයිහ" මහ සිටුතුමාට පහන් සිත් ඇතිව සියතින් මහදන් දීමේ විපාක කෙසේ ඇත්ද?

එවිට දිව්‍ය පුත්‍රයා පවසන්නේ පින්වත් අංකුරය ලෝභයෙන් මඩනා ලද මසුරු සිත් ඇති අය විසින් ඉවසිය නොහැකි දාන පරිත්‍යාගයේදි විභාග ඇති සත්පුරුෂ ධර්මය ඉසුලුවාවූ තමා වෙත පැමිණි යාචකාදීන් දැක මහත් සතුට උපදවා විශේෂයෙන් පැහැදුනු මුහුණ ඇතිව සිටි හෙයින් ශරීරයෙන් නික්මෙන රශ්මි ඇති ඒ "අසයිහ" සිටාණන්ගේ උත්පත්ති ගමන මෙනම් යැයි කියා හෝ අසවල් කාලයෙහි මෙහි නැවත පැමිණෙන්නේයැයි කියා හෝ මම නොදනිමි. එසේ වූවත් අසයිහ සිටුතුමා සක්‍ර දිව්‍ය රාජයාට එකතුව තවුතිසා දෙව් ලොව උපණයි යන මෙම කාරණය උපස්ථානයට පැමිණි මා විසින් වෙසමුණි මහරජුගෙත් සමීපයහිදී අසන ලදැයි කීවේය.

එවිට අංකුර තෙමේ පවසන්නේ "පින්වත් දිව්‍ය පුත්‍රය, පුණ්‍ය ක්‍රියා කල යුතුමය. තම තමන්ට හැකි පමණින් දන්දීම කල යුතුය. අනුන් කල පින අනුමෝදන් වීම පෙරදැරි කොට දානපතියාගේ නිවසට යන පාර පෙන්වා දුන් පමණින් කැමැති කැමති සම්පත් පහල වන අත් ඇති මෙම දිව්‍යරාජ වූ ඔබ දක්වන්නාවූ මා වැනි කවරෙක් නම් තමා හට පිහිට වූ පින් නොකරන්නේද? මෙසේ අනියම් වශයෙන් පුණ්‍ය ක්‍රියාවෙහි ආදර දක්වා දැන් තමා කෙරෙහි එම පින නියම කොට දක්වන්නා වූ" අංකූර තෙමේ කියන්නේ

මම මේ වාලුකා කාන්තාරයෙන් වාරවතී නුවරට ගොස් දන් දීම් පවත්වන්නෙමි. යම් දානයක් පරලොවදී මට පිහිට වන්නේද එබඳු ආහාර පාන වර්ග සහ වස්ත්‍ර සේනාසනයන්ද දන් දෙමි. ජල පහසුකම් සාදන්නෙමි. සතුන් වෙනුවෙන් හා රෝගී සතුන් වෙනුවෙන් කළ යුතු කාර්යය නොඅඩුවම ඉටු කරන්නෙමි. වෙනත්, වෙනත් මාර්ග පහසුකම් ආදියද, අසරණයන්ගේ ඕනෑ එපාකම් සලසන්නෙමි' යි කීහ.

එය අසා සිටි දිව්‍ය පුත්‍රයා මහත් සතුටට පත්ව "නිදුකාණනි, නුඹ නිසැකවම දන් දෙව, මම තොපට ඒ සඳහා ආධාර උපකාර කරන්නෙමි. යම් හෙයකින් නුඹගේ දාන වස්තු අඩු වන්නට ගියහොත් ඒ ගැන බලා මම අවශ්‍ය කටයුතු සපුරා දෙන්නෙමි'යි" කියා ඔහු දාන ක්‍රියාවට යොමු කර නැවත බමුණාට මෙසේ පැවසීය. "එම්බල වෙළෙන්ද, තොප මා බලහත්කාරයෙන් ගැලට නංවා ගෙන යාමට සූදානම් වූයේ තෝ මම කවුද? කියා නොදැනයි කියා" සියලු ගැල්වල තිබූ බඩුබාහිරාදිය අතුරුදහන් කරවා යක්ෂ වේෂයක් ගෙන භිය ගන්වා අවිහිංසාවෙන් පීඩාකර දෙවියන්ගේ බලය පෙන්වූහ.

එවිට අංකූර මහත් භියටත් වෙහෙසටත් පත්ව නොයෙක් ආකාරයෙන් දෙවියන්ගෙන් සමාව ඉල්ලමින් කන්නලව් කර බමුණා ලවා සමා කරවමින් පහදවා නැවත ගැල්වල තිබූ බඩු පුරවා රාත්‍රිය පැමිණිවිට දෙවියා හැරයන්නේ ඔහුට නොදුරු ස්ථානයක සිටි ඉතා බියකරු ලක්ෂණ ඇති එක්තරා ප්‍රේතයකු දැක ඒ ප්‍රේතයා විසින් පෙර ආත්ම භවයේ කරන ලද පාකර්මය විමසන්නේ මොන හේතුවක් නිසා තොපගේ ඇඟිලි කුණු වී වකුටු වුණාද? මුහුණ ඇකිලී විකාර වුණාද? දෑස්වලින් අසූචි සමාන කබ වැහිරෙන්නේද? යි විමසූ විට එම ප්‍රේතයා මෙසේ පැවසීය.

මා අසයිහ සිටුතුමාගේ යටතේ සිටි සියලුම දාන වස්තු භාරව සිටි ගබඩා පාලකයා වීමි. මම දානය සඳහා පැමිණි යාචකයින් දැක ඔවුන් දෙස අප්‍රසන්නව බැලීමෙන්ද, තරහව උපදවා ගැනීමෙන්ද, සිටුතුමාගේ තිබුණු කරුණා මෛත්‍රිය වෙනුවට මා කළේ එහි අනෙක් පැත්ත. එහි එන යාචකයින්ට පෙන්වූයේ මගෙන් දෙන දෙයක් විදියට මාන්න සිතින් දන් දෙන විට තව තව බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් මගහැර අනෙක් අයගේ ඉල්ලීම ඉටු කිරීම වාගේ වැඩයි. සිටුතුමාගේ තිබුණු නිහතමානිකම නිසා යාචකයින් සමඟ තිබුණු කුළුපගුකම ගැන එතුමා කෙරෙහි නොපෙන්වූවාට මම සිටියේ කෝපයෙන්. එහි අනිටු විපාක තමයි මම මේ විඳවන්නේ.

එපවත් ඇසූ අංකූර තෙමේ ප්‍රේතයාට ගරහමින් නීච පහත් පුරුෂය, තෝ සිටුතුමාගෙන්ම යැපෙමින්, සිටුතුමාටම යටි හිතින් ගරහපු ලාමකයාට ඔහොම වෙලා මදි. තොපත් මෙවන් විපතකට පත් වූයේ සිටුතුමාගේ නොසැලකිල්ල නිසයි. මට තොපෙන් ලැබුණේ ලොකු ආදර්ශයක්. ඒ අනුව එවැනි වැඩවලට ඉඩ නොතබා මම ආපසු වාරවතී නුවරට ගිය පසු දන් දෙමියි සිතා ගති. ඉන් පසු එතුමා නුවරට පැමිණ මනා ලෙස දන්සැල් පුරවා තම තමන්ට කැමති, කැමති දේ රැගෙන යාමට සැලසුවේය. එතුමාගේ භාණ්ඩ ගබඩා හිස්වන්න ඉඩ නොදී දෙවියන් ඒවා පුරවන්නේය.

වාලුකා කාන්තාරයෙහිදී දුටු ප්‍රේතයා ආදර්ශයට ගෙන සුදුසු තැන්වල සුදුසු සේවකයින් යොමු කරමින් නොනැවතී තමන්ගේ දැතිනුත් කටයුතු කරන්නේය. මෙසේ ක්‍රමානුකූලව දන්වැට පවත්වා ගෙන යන නිසා දුගී මගීන්ද ක්‍රමානුකූලව සමෘද්ධිමත් වීම නිසා අඞකුර තෙමේ නොසැහීමට පත්ව දාන කටයුතු භාරව සිටි "සින්ධක" නම් මානවකයා කැඳවා කියා සිටියේ සින්ධක අංකූර රජතුමා කීර්තියෙන් හා භෝග සම්පත්තියෙන් සම්පූර්ණව දානපතියෙක්ව, තම භෝග සම්පත්තියෙන් සම්පූර්ණව දානපතියෙක්ව සිටින නිසා සුවසේ නිදා ගනියි, සුවසේ අවදිවේයි කියා මහජනයා සලකති. මා ගැන එසේ සිතන ජනයා එම අදහසට අනුරූපව මම දූක සේ කණගාටුවෙන් සිටිනවානම් දූක සේ නිදමි. දූක සේ පිබිදෙමි දන්සැලට පැමිණ ජනයා පැමිණීම අඩුවනවානම් එය එසේම වන්නේය.

මෙය ඇසූ සින්ධකයා පෙරලා මෙසේ අංකූරගෙන් ඇසීය. "පින්වත් රජතුමනී, ඔබතුමාගෙන් සක්දෙව් රජතුමා කැමති වරයක් ඉල්ලන්නේ යැයි කීවොත් ඔබතුමා ඉල්ලන්නේ කුමන වරයක්ද?"

එවිට අඞකුරතෙමේ "පින්වත් සින්ධකය, දෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍ර දිව්‍ය රාජයා මට කැමති වරයක් ඉල්ලන්නේ යැයි කීවොත් මම මෙම වරය ඉල්ලමි."

උට්ඨාන වීර්යයයෙන් සමන්විත වූ මට සූර්යයා උදාවන කල්හී දිව්‍යාහාර පහල වන්නාහුද, යාචකයෝද, සිල්වත් යහපත් ස්වභාව ඇත්තොවෙන්ද, මා වෙත පැමිණෙන ජනයන්ට දන් දෙන්නා වූද, මාගේ දාන වස්තු අඩු නොවන්නේද, දිය යුතු දානයකදී කිසියම් අප්‍රසාදයක් දැක එයින් පසු තැවීමක් නොවෙන්ද, දෙන දානය වෙනුවෙන් ප්‍රසාදයක් උපදීද මේ ආකාරයට සක් දෙවියන්ගෙන් ආරෝග්‍ය සම්පත්තියද, දාන වස්තූන්ගෙන් අපරිමිත සම්පත්තියද, දෙය ධර්ම සම්පත්තියද, දක්ෂිණාර්හ සම්පත්තියද, දායක සම්පත්තියද ගනිමි'යි කීහ.

මෙහි "අළුයම අවදිවීම" යනු නිරෝගී සම්පත්තියද, "දිව්‍ය ආහාර පහල වීම" යන්නෙන් දෙය ධර්ම සම්පත්තියද, "යාචකයෝ සිල්වත්හු වේවා" යි යනුවෙන් දක්ෂිණාර්හ සම්පදාවද "දන් දෙන්නා වූ මාගේ දාන වස්තු අඩු නොවේවා" යන්නෙන් දාන වස්තු වල අප්‍රමාණ සම්පත්තියද, මම දන් දී පසුතැවිලි නොවෙමි. දන් දෙන මම පහන් සිතින්ම දන්දෙමි. දායක සම්පත්තියද ඉල්ලා සිටින්නේ මෙලොව පරලොව සැමට යහපත වන නිසාය.

මෙසේ එතුමා තම අදහස කියා සිටියදී එහි සිටියා වූ නීති ශාස්ත්‍රය පුරුදු කල "සොනක්" නම් පුරුෂයෙක් එතුමාගේ දන්දීම පාලනය කරනු පිණිස "න සබ්බ විතනානි" යන මෙම ගාථා පදය මූලික කර ගෙන ගාථා දෙකකින් තම අදහස දන්වා සිටියේය. පින්වත් අංකූරය දක්ෂිණාර්හයො ලැබුවයි කියා සවිඤ්ඤානක අවිඤ්ඤානක ප්‍රබේද ඇති සියලු සම්පත් කිසිවක් ඉතිරි නොකොට නොදිය යුතුය. තමාගේ ආදායම් තත්වය බලා දන් දිය යුතුය. නොලත් දෙය ලැබීම හා ලද දෙය ආරක්ෂා කර ගත යුතුය. මෙයාකාරයට ධනය ආරක්ෂා කර ගත යුතුය. ලැබෙන ධනයෙන් කොටසක් එදිනෙදා දිවි පැවැත්ම සඳහාද, තව කොටසක් ආදායම් මාර්ග ලැබීම සඳහා ද, තවත් කොටසක් කරදරයක් විපතක් පැමිණි කල ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කර ගත යුතුය.

මෙයාකාරයට ධනය ආරක්ෂා කර ගත යුතුය. දානය එම වස්තු හේතුකොට ගෙන ඇති බැවින් මාත්‍රා තුනම ඔවුනොවුන් පිරිසිඳු කිරීමෙන් සෙවිය යුතු යැයි කියා, යි යම් හෙයිකින් ධනය රකිමින් දන්දීම කරන තැනැත්තා

දෙලොව යහපත පිණිස පිළිපදින්නේද දානයන් ධනය මූලික කොට ඇතිවේද, එම නිසා දීමට වඩා ධනයම උතුම් වෙයි. ලැබෙන ප්‍රමාණයම නොලබා දන්දීමෙන් පසුව දුකට පත්වේ. බත් හැන්දක්වත් සහල් මිටක්වත් දන් නොදීමද, පමණ ඉක්මවා දන් දීමද, නුවණැත්තෝ ප්‍රසංසා නොකරති. නොදීම හේතුවෙන් පරලොව සැපතින් පිරිහෙයි. අධික ධාන හේතුවෙන් ඉහත ආත්මභාවයේ කුල ප්‍රවේණිය නොපවතියි. විෂම නොවූ ලෞකික පරීක්ෂකයන් විසින් ගර්හිත නොවූ මධ්‍යම න්‍යාය ක්‍රමයෙන් දන් පවත්වන්නේය. මේ කියන ලද යම් දාන අදාන හේතුවක් වේද එය ඥානවන්තයන්ගේ පිළිගැනීම වේ.

එය අසා අංකුරතෙමේ සොනකයාගේ තර්ක විතර්ක කරමින් මෙසේ පැවසීය. එම්බල මානවකය, දීමට වඩා ධනය ආරක්ෂා කිරීම වටී යයි යම් නීති තර්කයක් කියන්නත් මාගේ දීම මේයාකාරයෙන්ම ඉදිරියට පවත්වා ගෙන යමි. මට උවමනා කරන්නේ මගෙන් යමෙක් කිසියම් වස්තුවක් බලාපොරොත්තුව පැමිණෙන්නේද එය ඔහුගේ සිත පුරා දීමටයි. ගෘහ වාසීවූ පුද්ගලයෙකුට අභිංසකයින් දැක පළමු කොට මාගේ පිංකෙත පැමිණියේයැයි හටගත් සතුටු සිතිවිල්ල හේතුකොට මුඛ වර්ණය පහදීද, හැකි පමණින් ඔවුන්ට දන් දී සිත් සතුටුවීමක් වේද, යාචකයින් දැක සතුටු සිතක් ඇති වේද, ඔවුන් තමාගෙන් දන් බලාපොරොත්තුව පැමිණීම ගැන සිතෙහි ප්‍රසාදයක් උපදීද, එම ප්‍රසාදය සිතින්ම හැකි පමණින් දන් දී සතුටුවෙන්ද එම ගෘහවාසියාට සැපතක්ම වේ. මෙය පිනේ සම්පත් පිරීම නම් වේ.

තමා සතු තැන්පත් ධනයක් තැන්පත්භාවයෙන් ඉවත් කර මෙම ධනය මම රැගෙන යා යුතු යැයි සිතා දන් දෙමියි කියා සිත එකඟකරගත් මොහොතේ පටන්ම කුසල සිත පහල වේ. දන් දෙන අවස්ථාවේ මාගේ උවමනාවකට නොගෙන තිබෙන මෙම වස්තුව තවත් කෙනෙකුට යහපතක්, ප්‍රයෝජනයක් සිද්ධ වෙනවානම් එය මමත් දන් දීම වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ලබපු කෙනෙක් ප්‍රයෝජනයට ගත්තා. එතුමන්ටත් කවදා හෝ දන් දීමේ සිතක් පහල වීමට මෙය හේතු කාරණාවක් වෙනවායි සිත පිරිසිදු කර ගත යුතුය.

මෙසේ අංකුරතෙමේ තමා පිළිපදින ප්‍රතිපත්තිය ප්‍රකාශ කොට තව තවත් දන් වැට තර කර දන් දීමේදී එම රාජ්‍යෙයහිද අසවල් රාජ්‍යවලද මිනිසුන්ට කිසි අඩුපාඩුවක් නැති නිසා ගොවිතැන් කිරීමෙන් වැළකී දාන ශාලා වලින්ම කය නොවෙහෙසා නිදැල්ලේ සිටීමට විය. ගොවිතැන් නොකිරීමෙන් ගොවිබිම් හිමියන්ද, පාලකයන්ද තම තමන්ට ලැබෙන බිම් පංගු නොලැබීම නිසා ගබඩා හිස්වන්නටත්, ආදායම නැති විය. ඉන්පසු ඔවුන් එක්ව පිංවතාගේ දානය නිසා අපගේ ආදායම් මාර්ගය හීන විය, භාණ්ඩාගාර හිස්විය. එබැවි තේරුම්ගන්නැයි දන්වා දූතයෙකු යැවීය. ඒ අසා අංකුරතෙමේ දක්ෂිණ පථයට ගොස් දෙමළ ප්‍රදේශයක මුහුදට නොදුරු ස්ථානයක දන්සැල් පවත්වා ජීවිතය පුරාවට දන්දෙමින් මිය පරලොව ගොස් තවුතිසා දෙව්ලොව දිව්‍ය පුත්‍රයෙක්ව උපන්නාහ.

එතුමාගේ දන්දීම පිළිබඳවද, දෙව්ලොව ඉපදීමද, කරුණු කාරනා එක් රැස් කරමින් "සංගීනි" පඬිතුමා මෙසේ විස්තර කර තිබෙන්නේය.

දන්දීමෙහි සිත් ඇලුනාවූ අංකුර රජතුමාගේ නිවසෙහි දවසක්, දවසක් පාසා සුවඳවත් ඇල් සහලින් පුරවන ලද ගැල් හැට දහසක් පුරවා දන් වැට පැවැත්වූහ. එතුමාගේ එම දන්වැට නිසියාකාරව පවත්වා ගෙන යන එතුමාගෙන් යැපෙන සේවකයෝ තුන්දහසක් පමණ සේවයේ යෙදී සිටියහ. මොවුන් සැපයීම් අංශයට පමණක් සීමා විය. තවද කෑම් බීම් පිසීම, සකස් කිරීම දන් වැට බලාපොරොත්තුව පැමිණෙන යාචකාදීන්ගේ අවශ්‍යතා සැපයීම පිණිසත්

සර්වාභරණයෙන් සැරසුනු මිනිසුන් හැට දහසක් පමණ එතුමන්ගෙන්ම යැපුණි. එම දන්වැට සඳහා මිරිස්, තුනපහ ආදිය සකස් කර දීම සඳහා සර්වාභරණයෙන් සැරසුනු කාන්තාවෝ තුන්දහසක් පමණ සිටියහ. ඔවුන්ද එතුමා නිසා යැපුණාහ.

එම කාලයේ මිනිසුන්ගේ පරමායුෂ අවුරුදු විසි දහසකි. (මෙය වරදවා තේරුම් නොගත යුතු භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාලේත් පරමායුෂ අවුරුදු විසිදහසේ කාලයෙහිය. අප ගෞතම බුදුරජාණන්වහන්සේ ලොව පහල වී වදාලේ හතරවන අතුරුකප පරමායුෂ අවුරුදු එකසිය විස්සක් තිබෙන කාලයේ භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාලේ තුන්වන අතුරුකප අවුරුදු විසිදහසේය. එම තුන්වන අතුරුකප එම කාල වකවානුවේ එම බුදුරජාණන් වහන්සේගේ පිරිණිවීමත් ශාසන අතුරුදහන්වීමත් එකී කාලය ක්‍රම ක්‍රමයෙන් අවුරුදු 10ක් දක්වා පහත බැස සත්ව විනාශයෙන් පසු නැවත ගුණ ධර්ම පුරමින් පරමායුෂ අවුරුදු අසංඛෙය්‍ය දක්වා ආයු වර්ධනය වෙමින් නැවත ගුණ ධර්ම පිරීම් අඩුවෙමින් එමෙන් අවුරුදු විසිදහසක පරමායුෂ තිබුණු බුද්ධ ශුන්‍ය කාල වකවානුවක සිදු වූ සිද්ධියක් තමයි මෙම කතා වස්තුව. )

අංකුර රජතුමා බොහෝ විට අනුන්ට නියෝග කිරීමෙන් තොරව නිරහන්කාරයෙන් තම දෑතින්ම දානය දෙන්නේය. දීර්ඝ කාලයක් ඍතු බේදයෙන්ද, ශීත, උෂ්ණ, වර්ෂාවෙන්ද පවතින කාල වකවානුද භේදයක් නොමැතිව දන් දුන්හ. එතුමා තව්තිසා දෙව් ලොව දිව්‍ය සම්පත් විඳිමින් සිටින අතර, අපගේ ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේ ලෝ පහල වී වදාල සේක.

එම කාලයෙහි ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ පිණ්ඩපාතය සඳහා වඩිනු දුටු **"ඉන්දික"** නම් යාචකයෙක් තමාට නිවසින් ලැබෙන බත් පිරිසියක් මහත් ගෞරවයෙන් යුතුව මහරහතන් වහන්සේගේ පාත්‍රයට බෙදීමට සලස්වා මහත් සතුටට පත්වෙමින් බලා සිටියේය. එම සිදු වීම නිතර සිහිපත් කරමින් සතුටු සිතින් ජීවත්ව මියගොස් තව්තිසා දෙව්ලොව මහත් ඍධි සම්පන්න මහානුභාව දිව්‍ය පුත්‍රයෙක්ව උපන්නේ දිව්‍යමය රූප සම්පත් ආදි කරුණු දහයකින් අංකුර දිව්‍ය පුත්‍රයා අභිබවා ඉදිරියෙන් සිටියේය.

මෙලෙස මෙම දිව්‍ය පුත්‍රයන් දෙදෙනා දිව්‍ය ශ්‍රී සම්පත්තිය විඳිමින් සිටින අතර, භාග්‍යවත් අර්හත් ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේ බුදු බවට පත්ව හත්වන අවුරුද්දේ ඇසල මස පුර පසලොස්වක දින සැවැත් නුවර දොරටු සමීපයෙහි ගන්ඩබ්බ වෘක්ෂ මූලයේදි යමා මහ පෙලහැර කොට පිලිවෙලින් පාද තුනක වික්‍රමයෙන් දෙව් ලොවට වැඩම කර පරසතු රුක් මුල පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි යුගන්දර ජීවිත මස්තකයෙහි සූර්ය දිව්‍ය රාජයා මෙන් බබලමින් දශවිධ ලෝක ධාතුවෙන් රැස් වූ දිව්‍ය, බ්‍රහ්ම සේනාවන්ගෙන් විහිදුන ආලෝකය යටපත් කර තමන් වහන්සේගේ ශරීරාලෝකයෙන් මැඩපවත්වමින් අභිධර්ම දේශනාවට වැඩහුන්සේක්, ලඟ සිටිය ඉන්දික දිව්‍ය පුත්‍රයාද, දොලොස් යොදුනක් ඈතින්ව සිටි අඞකුර දිව්‍ය පුත්‍රයාද දැක වදාරා දක්ෂිණාහි සම්පත් වදාරනු පිණිස එය අරභයා මෙසේ වදාළ සේක.

එම්බා අංකුර තොප විසින් අති දීර්ඝ කාලයක් මහදන් දී තිබියදීත් මා ආසන්නයෙන් ඉතා ඈත්ව සිටින්නේ තොප සමඟ මාගේ අනෙක් පස සිටින ඉන්දික දෙවියන් ඉඳගත් ස්ථානයෙහිම සිටීමටත් තොප මනු ලොවදී මොන ආකාරයක කුසල් සම්පත් කරගත්තෙහිද?

එවිට අංකුර දෙවියන් මෙසේ පැවසීය. මාගේ භාග්‍යවත් අර්හත් ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්ස, මම මනු ලොව රාජ්‍ය කරන සමය අබුද්ධෝත්පාදක කාලයකි. එම කාලයෙහි සිල්වත්, ගුණවත් පැවිදි උතුමාණන්වහන්සේලාත්, මහණ බමුණන්වත් නොසිටි කාලයකි. එනමුත් මම අවුරුදු දහසය දාහක්ම මහත් ගෞරවයෙන් හා සේවකයින් කොපමන සිටියත් මම දිවා රෑ දෙකේම වෙහෙස මහන්සි නොබලා සිතට ගතට විවේකයක් නැතිව දුගී, මඟී යාචකයින්ට මහත් අනුකම්පා ඇතිව කිසිම ලෝභ සිතක් උපදවා නොගෙන මහත් දන්දීමේ ආනිසංස බලයෙන් තව්තිසා දෙව්ලොව ඉපදීමටත් එහිදී ඉතා දුර්ලභ වස්තුවක් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේ නමක් දකින්න, කථා කරන්න ලැබීමත් මාගේ හේතු වාසනාවක් හැටියට මම සතුටුවෙමි.

ඉන් පසු බුදුරජාණන්වහන්සේ සමීපයෙහි සිටි ඉන්දික දෙවියන් අමතා, තොප විසින් මෙපමණ මහේෂාක්‍ය දිව්‍ය ආත්මයක් ලැබීමට මනු ලොවදී කිනම් ආකාරයෙහි කුසල් දහම් රැස්කර ගත්තෙහිද? යි අසා වදාළ සේක.

එවිට ඉන්දික දෙවියන් මෙසේ පැවසීය. මාගේ අමා මෑණි පරදුක්ඛ තම දුක්ඛ සේ සිතමින් දීපන්කර පාද මූලයෙහිදී නිවනේ දොරටුවටම පැමිණත් මේ වේලාවේ අප්‍රසිද්ධියේ නිවනට වැඩියොත් මේ බුදුරජාණන්වහන්සේගේ ඉතිරිවන සත්ව සන්හතියට කාගේ පිලිසරණක්ද? යි සිතා ක්‍රියා කරපු නිසා අඳුරේ ගමන් කර ආලෝකය දුටු මාගේ මිත්‍ර අංකුර දෙවියන්ටත් මා ඇතුලු අපමණ සත්ව සමූහයටත් ඇති භයානක දුක් සංසාර ගමන නිමා කිරීමේ භාග්‍ය උදා කර දුන් බුදු පියාණෙනි.

මම මනු ලොව ජීවත් වූයේ අන්ත අසරණ දුගී යාචකයෙක් ලෙසයි. මාගේ මිත්‍ර අංකුර දෙවියන් මනු ලොවදී එක් යාචකයකුට එක වේලාවකට දුන්නා වූ දානයෙන් අඩකටත් අඩු කොටසක් මා වෙත එක් නිවසකින් දිනපතා ලැබෙන බත් පීරිසිය ලබා ගැනීම සූදානම් වූ වේලේ පිණ්ඩපාතේ වඩින බුද්ධ පුත්‍ර වූ අනුරුද්ධ මහරහතන්වහන්සේ දැක මහත් සතුටක් ඉපදී එම නිවැසියන්ගෙන් ඉල්ලා සිටියේ මෙතෙක් කල් මට දුන්නා වූ බත්වල ආනිසංස බලය ඉක්මවා යන අවස්ථාවක් ඔබලාටත් මටත් උදාවී තිබෙන්නේ. එම නිසා මට දෙන බත් පීරිසියේ ගෞරවයෙන් යුතුව මහරහතන් වහන්සේගේ පාත්‍රයට ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන් බෙදෙන අයුරු බලා සිටි මට ඇති වූයේ අපමණ සතුටකි. ඒ හැර මට වෙනම කුසලයක් මනුලොවදී කර ගැනීමට බැරි විය.


යමෙකුට දෙන දානය මහත් ඵල මහානිසංසවේද එම පින් කෙත නුවණින් සොයා දන් දිය යුතුයි. දායකයෝ සිලවතුන් නුවණින් සොයා බලා දන් දී ස්වර්ග ලෝකයට පැමිණෙති. මේ ලෝකයෙහි දක්ෂිණාව පිලිගැනීමට සුදුසු වූ සිල්වත්හු ඇත්තාහු තම ඔවුන් සොයා දන් දීම බුදුරජාණන්වහන්සේගේ ප්‍රශංසාවට බඳුන් වූහ.

මෙම අංකුර ප්‍රේත වස්තුව සර්වඥයන් වහන්සේ තව්තිසා දෙව්ලොවදී, දස දහසක් සක්වල දෙවියන් ඉදිරියේදී දක්ෂිණා හි සම්පත් ප්‍රකාශ කරනු පිණිස මහා දානං තයාදින්නං යනාදියෙන් තමන් වහන්සේ විසින් උපදවන ලදි. එහිදි තුන් මාසයක් අභිධර්මය දේශනා කොට මහා පවාරන දිනයෙහි දිව්‍ය සමූහයා විසින් පවරන ලද්දා වූ දේවාති දෙවවූ සර්වඥයන් වහන්සේ දෙව්ලොවින් නික්ම සංකස්ස නුවරට බැස අනුක්‍රමයෙන් සැවැත් නුවරට වැඩමවා දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් සිව් පිරිස මැද දක්ෂිණාර්හ සම්පත් ප්‍රකාශ කරනු පිණිස විස්තර වශයෙන් දේශනාව අවසානයේ බොහෝ ප්‍රාණින්ට ධර්මාවබෝධ වූහ.

-අංකුර ප්‍රේතවස්තු වර්ණනාව නිමි-

**සැලකිය යුතු කරුණු :-**

★ ශීල, සමාධි, ප්‍රඥා ලෙස ආර්යාා අෂ්ඨාංගික මාර්ගය හැඳින් වූවත් සටහන් වීමේදී ප්‍රඥාව මුලට යෙදෙන්නේ එහි සම්‍යග් දෘෂ්ඨිය දියුණු වීම අනෙක් චෛතසික ධර්මයන්ගේ දියුණුවට උපකාරයෙන් දියුණු වන බැවිනි. ඒවා වැඩෙන්නේ චක්‍රයක් ලෙසට එකිනෙකට සහය වෙමිනි.




★ ප්‍රඥාවන්තයෙකුට සිල් රැකීම පහසුය. එම නිසා සිතේ සමාධිය ඇති වේ. සමාධි සිත තව තවත් ප්‍රඥාව දියුණු වීමට උපකාර වේ. මෙසේ සීල නිසා සමාධියත් සමාධිය නිසා ප්‍රඥාවත් ඔවුනොවුන් බලවත්ව වැඩේ.

★ පංච ශීලය රකින්නා විශේෂ දිනයන්හීදි අට සිල්, නව සිල්, දස සිල් රැකීමෙන් පංච ශීලය රැකීමට මහත් බලයක් වේ.

★ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්‍යල් කර්මාන්ත පංචශීලය රකින්නෙකු අතින් ආරක්ෂා වන අතර, අනෙක් මාර්ග අංග වැඩි වීමටත් උපකාරි වේ. එම නිසා පංචශීලය රකින ගිහි සැප විඳින පිංවතුන්ට පවා මාර්ගඵල අවබෝධ කර ගත හැක.

★ ආර්යාා අෂ්ඨාංගික මාර්ගයේ (මධ්‍යම ප්‍රතිපදාව) විරති චෛතසික තුනෙන් එකක් පමණක් එක් සිතක පහල වේ. අනෙක් චෛතසික 4,5,6 වශයෙන් එක් සිතක ඇති වූවත් මාර්ගස්ථ සිතේ විරති තුනම හා අනෙක් සිළු චෛතසික පහල වේ.

★ මෙම සියල්ල පළමු වර සිතේ පහල වීම (චිත්ත වර්ය) සෝවාන් මාර්ගඵල, 2 වන වර, 3 වන වර, 4වන වර ආදී කෙදිනක හෝ මෙම චෛතසික ධර්ම සමඟ චිත්ත විථි ඇති වීම සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ගඵලයන්ට පත් වීමයි. දුක් කෙළවර කිරීමයි.

**සමථ භාවනාව මඟින්**

(විදර්ශනාවට ඕනෑම ධ්‍යානයක සිට යොමුවිය හැක.)

★ උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත) 1 වන ධ්‍යානය (අර්පණා), 2වන ධ්‍යානය, 3වන ධ්‍යානය, 4වන ධ්‍යානය

1----5 2----5 3----5 4----5

5වන ධ්‍යානය 1-----5 → අරූප ධ්‍යාන වැඩම කළ හැක. → අභිඥා ඉපදවීම කළ හැක.

**විදර්ශනා භාවනාව මඟින්**

★ උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත) 1 වන ධ්‍යානය (අර්පණා), සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ග ඵලයන්ට පත් වීමයි.

1----5 1----5 1----5 1----5 1----5

**ධ්‍යාන අංග චෛතසිකය :-**

| විතක්ක | විචාර | ප්‍රීති | උපේක්ෂා / සුඛ | ඒකාග්‍රතා |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | වේදනා චෛතසිකය 4 | 5 |

